සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ගෘහ ආර්ථික විද්‍යාව - I

**12 ශ්‍රේණිය**

**කාලය පැය 01 යි.**

උපදෙස්:-

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියෙන් ලියන්න.

---

(01) වර්ණ චක්‍රයේ එක ළඟ ඇති වර්ණ 2 සමඟ ඇති ගැලපුම,

(1) ඒක වර්ණ ගැලපුම (2) ද්විත්ව අනුපූරක වර්ණ ගැලපුම

(3) බෙදුනු අනුපූරක වර්ණ ගැලපුම (4) බද්ධ වර්ණ ගැලපුම (........)

(02) හොඳින් හිරු එළිය වැටෙන ස්ථානයකට යොදාගත හැකි වර්ණ,

(1) නිල්, කොළ, දම් (2) රතු, තැඹිලි, දම්

(3) නිල්, රතු, කහ (4) කහ, කොළ, දම් (........)

(03) කාමරයක් විශාල කර පෙන්වීමට යොදා ගත හැකි වර්ණ නම්,

(1) සමාන්තර බිත්ති 2 එක වර්ණයක් වීම. (2) බිත්ති හතරම ලා වර්ණ

(3) දීප්තිමත් වර්ණ ආලේප කිරීම (4) යාබද බිත්ති 2 තද වර්ණ වීම (........)

(04) කාමරයක ඇතුලත තෙතමනය රැඳවීම වැළැක්වීමට කළ යුත්තේ,

(1) බිත්ති හොඳින් කපරාරු කර වර්ණ ගැන්වීම.

(2) විදුලි පංකා භාවිතය

(3) වහලයේ උස අඩු කිරීම.

(4) වහලයට සිවිලිමක් යෙදීම. (........)

(05) නිවසක ස්වභාවිකත්වය හා ක්‍රියානුරූපී බව ළඟා කර ගත හැක්කේ,

(1) විසිත්ත කාමරයේ පොකුණක් නිර්මාණය කිරීම.

(2) තරප්පු පෙළෙහි අත්වැට සුදු යකඩෙන් සෑදීම.

(3) ගසක කඳ කොටසින් බංකුවක් සැකසීම.

(4) පිත්තල පින්තූර හා පිත්තල භාණ්ඩවලින් ගෙදර අලංකාර කිරීම. (........)

(06) වර්ණ භාවිතයේදී වැදගත් වන කරුණකි.

(1) උණුසුම් වර්ණ මේ සඳහා භාවිත කිරීම.

(2) විවිධ අංගයන්ගෙන් වර්ණ ගැලපුමේ වර්ණ භාවිත කිරීම.

(3) සම ප්‍රමාණයන්ගෙන් සියළුම වර්ණ භාවිතා කිරීම.

(4) සමාන ප්‍රමාණ හා සමාන තීව්‍රතාවයකින් භාවිත කිරීම. (........)

(07) නිවසක් අලංකරණයේදී තිර රෙදි මෝස්තර වර්ග 4 කි.

(1) ස්මොකින් ප්ලීට්ස් ක්‍රමය (2) ටියර් ක්‍රමය

(3) කැෆේ ක්‍රමය (4) ටයිබැක් ක්‍රමය (........)

(08) නිවසෙහි බාහිර පරිසර අලංකරණයේදී අවධානය යොමු කළ යුත්තේ,

(1) මුදල් වැය කිරීම හා ජල සැපයීම (2) නඩත්තුව හා සංවිධානය

(3) ගෘහ භාණ්ඩ යොදාගැනීම (4) උපාංග යොදාගැනීම (........)

(09) කැල්සිෆේරෝල් යනු,

(1) විටමින් A (2) විටමින් D

(3) විටමින් C (4) විටමින් K (........)

(10) විටමින් $B_6$ හඳුන්වන රසායනික නාමය වන්නේ,

(1) පිරිඩොක්සින් (2) නයසීන්

(3) තයමින් (4) ඇස්කොබික් (........)

(11) ව්‍යුහයෙහි කාබොක්සිල් කාණ්ඩයක් අඩංගු වන පෝෂකය වන්නේ,

(1) මේදය (2) මේදය හා ප්‍රෝටීන්

(3) ප්‍රෝටීන් (4) කාබෝහයිඩ්‍රේට් හා මේදය (........)

(12) විටමින් A හා යකඩ බහුලව අඩංගු වන ආහාර ප්‍රභවයකි.

(1) බිත්තර (2) කිරි

(3) කරවල (4) නිවිති (........)

(13) තයිරොක්සින් හෝමෝනය නිපදවීමට ඉවහල් වන පෝෂකයකි.

(1) ෆොස්පරස් (2) මැග්නීසියම්

(3) අයඩීන් (4) කැල්සියම් (........)

(14) ප්‍රතිඔක්සිකාරක විටමිනයකි.

(1) ටොකොෆේරෝල් (2) නැප්තාක්විනෝන්

(3) තයමින් (4) කැල්සිෆෙරෝල් (........)

(15) අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ල 2 කි.

(1) ග්ලයිසීන් හා ඇලනීන් (2) අයිසොලියුසීන් හා ත්‍රියොනීන්

(3) සිස්ටීන් හා ත්‍රියොනීන් (4) අයිසොලියුසීන් හා ඇලනීන් (........)

(16) පොල්තෙල්වල බහුලව අඩංගුවන සංතෘප්ත මේද අම්ලයකි,

(1) ඇරකිඩොනික් අම්ලය (2) ලෝරික් අම්ලය

(3) ඔලීක් අම්ලය (4) ලිනොලීක් අම්ලය (........)

The National e-Learning Portal for The General Education

(17) නිරක්තිය කෙරෙහි බලපෑම් ඇති කෙරෙන ක්‍ෂුද්‍ර පෝෂකය කුමක්ද?

(1) අයඩීන් හා තඹ (2) අයඩීන් හා යකඩ

(3) තඹ හා යකඩ (4) අයඩීන් හා ෆ්ලුවොරීන් (........)

(18) විශේෂ අවස්ථාවක සපයනු ලබන ප්‍රධාන ආහාර වර්ග නම්,

(1) කිරිබත්, පොංගල් බත්, බුරියානි (2) නූඩ්ල්ස්, වෙරි, මුං කිරිබත්

(3) ඉදි ආප්ප, පිට්ටු, තෝසෙ (4) කේසරී, වඩේ, හැලප (........)

(19) නයිට්‍රජන් ධන තුලනය ඇති විය හැකි අවස්ථාවකි.

(1) අධික ලෙස පිළිස්සීමකදී (2) මහලු වියේදී

(3) ගර්භණී හා ක්ෂීරණ වියේදී (4) ළදරු වියේදී (........)

(20) ක්ෂය වීම පෙන්නුම් කරන විශේෂ ලක්ෂණයකි.

(1) උස යාමේ වේගය නැවතීම. (2) වයසට සරිලන බර නොතිබීම.

(3) උසට සරිලන බර නොතිබීම. (4) වයසට සරිලන උස නොතිබීම. (........)

(21) ආහාර ඇසුරුම් කිරීමේ තාක්ෂණ ක්‍රමයකි.

(1) වායු රෝධක කිරීම (2) තාපයට භාජනය කිරීම

(3) බ්ලාන්ච් කිරීම (4) විනාකිරෙන් පිසීම (........)

(22) ප්‍රෝටීන් පරිවෘත්තිය හා සම්බන්ධ ක්‍රියාවේදී සිදු නොවන ක්‍රියාවකි.

(1) රුධිරය නිෂ්පාදනය (2) ග්ලූකෝස් බවට පත්වීම

(3) හෝමෝන නිෂ්පාදනය (4) එන්සයිම නිෂ්පාදනය (........)

(23) ඇසිඩෝසියාව ඇතිවීමට හේතුවකි.

(1) උෂ්ණත්වය අඩු වීම. (2) ලවණ සාන්ද්‍රණය නියතව පැවතීම

(3) පිටවන ජල ප්‍රමාණය වැඩි වීම. (4) පරිසර උෂ්ණත්වය වැඩි වීම. (........)

(24) සම්පූර්ණයෙන් ම මුද්‍රා තබා ඇසිරීමට සුදුසු වන්නේ,

(1) සෙලෝෆේන් (2) ලෝහ

(3) ප්ලාස්ටික් (4) කාඩ්බෝඩ් (........)

(25) ආහාර ද්‍රව්‍ය අලෙවියේදී පාරිභෝගිකයා පොළඹවා ගැනීමට යොදාගනු ලබන්නේ,

(1) ප්‍රචාරණය (2) ඇසුරුම් ක්‍රම

(3) වට්ටම් ලබා දීම (4) ප්‍රමිති කිරීම (........)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ගෘහ ආර්ථික විද්‍යාව - II

**12 ශ්‍රේණිය**

**කාලය පැය 03 යි.**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගිනි.**

(01) (1) ගෘහයක් සැලසුම් කිරීමේදී උපයෝගී කරගන්නා මූලධර්ම 5 නම් කරන්න.

(2) මෙයින් දෙකක් පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(3) ස්වභාවික වාතාශ්‍රය නිවසක් තුළට ලබාගත හැකි ක්‍රම 3 ක් ලියන්න.

(4) යම් වස්තුවක් නිර්මාණයේදී යොදාගන්නා මූලිකාංග මොනවාද?

(5) විවිධ හැඩැති රේඛා මොනවාද?

(02) (1) වර්ණ චක්‍රය දක්වා අන්තර් මාධ්‍යමික වර්ණ හඳුන්වන්න.

(2) නිවස අලංකරණයේදී යොදාගනු ලබන හැඩතල හා වයන මොනවාද?

(3) නිවෙස් වර්ණ ගැන්වීමේදී යොදාගනු ලබන වර්ණ ගැලපුම් සඳහා උදාහරණ දක්වන්න.

(03) (1) කාබෝහයිඩ්‍රේට් වර්ගීකරණයට අනුව ඩයිසැකරයිඩ වර්ග කර දක්වන්න.

(2) ඇමයිනෝ අම්ල යන්න හඳුන්වා සරලම අමයිනෝ අම්ලය හඳුන්වන්න.

(3) ප්‍රෝටීන්වල කාර්යයන් 2 ක් ලියන්න.

(04) (1) පෝෂණය යන්න අර්ථ දක්වන්න.

(2) ශරීරය නිරෝගී කිරීමට ජලය මහෝපකාරී වේ. ජලයෙන් ඇති ප්‍රයෝජන මොනවාද?

(3) කෙටි සටහන් ලියන්න.

(අ) අවශෝෂණය

(ආ) ආහාර ජීර්ණය

(05) (1) පහත මැහුම් ක්‍රම ඇඳ නම් කරන්න.

(i) ලේසි ඩේසි මැස්ම (ii) මකුළු දැල් මැස්ම

(iii) බුලියන් මැස්ම

(2) නයිලෝන් කෙන්ද හඳුනාගැනීමේ පරීක්ෂණයෙන් අනතුරුව දැකිය හැකි ලක්ෂණ මොනවාද?

(3) අන්වීක්ෂීය පරීක්ෂණයෙන් කපු, ලිනන් සේද කෙඳි වල හරස්කඩ ඇඳ දක්වන්න.